FEDERAL COURT OF AUSTRALIA

# APPEALS

## ඕස්ට්‍රේලියාවේ ෆෙඩරල් උසාවිය

# ඇපැල්

Sinhalese

# ඇපැල්

1976 යේ ඕස්ට්‍රේලියාවේ ෆෙඩරල් උසාවි පනත යටතේ උසාවියට මේවා සඳහා ඇපැල් ඇසිය හැක:

- ෆෙඩරල් උසාවියේ තනි විනිසුරුවෙකු විසින් දෙනු ලැබූ අතුරු හෝ අවසාන විනිසුම්;
- ඕස්ට්‍රේලියානු අගනුවර දේශභූමිය සහ උතුරු දේශභූමිය හැර වෙනත් භූමි ප්‍රදේශක ශ්‍රේෂ්ඨාධිකරණකින් දෙනු ලැබූ විනිසුම්;
- ප්‍රාන්තයක, ඕස්ට්‍රේලියානු අගනුවර දේශභූමියේ හෝ උතුරු දේශභූමියේ ( ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ අධිකරණයකින් හැර) ෆෙඩරල් අධිකරණ බලය භාවිතා කරණ උසාවිවලින් දෙන ලබන සමහර විනිසුම්:
- ෆෙඩරල් මහෙස්ත්‍රාත් උසාවියෙන් ගණු ලබණ සමහර විනිසුම්.

උසාවි හැර පුද්ගලයින්, බලධාරින්, විනිශ්චය සභා විසින් ගනු ලබන තීරනවලින් ඇතිවන ඇපැල්ද උසාවිය විසින් අසනු ලැබේ. ඔබට අවශ්‍ය විශේෂිත පෝර්ම සහ පරිපාට පිළිබඳ වැඩි තොරතුරු ෆෙඩරල් උසාවි රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ අන්තර්ජාලයේ ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්.පෙඩ්කෝට්.ගව්.ඒයූ වලින් ලබාගතහැක.

# ඇපැල් අසන්නේ කවුද ?

ෆෙඩරල් උසාවියේ අග විනිසුරු තුමා විසින් තනි විනිසුරුවකු විසින් ඇසීම ප්‍රමාණවත් යැයි නිගමනය කරන්නෙ නැත් නම් සංක්‍රමණ පිළිබඳ නොවන ෆෙඩරල් මහෙස්ත්‍රාත්තුමකුගේ විනිසුමක් පිළිබඳ ඇපැලක් පූර්ණ අධිකරණයක් මගින් අසනු ඇත.

ෆෙඩරල් අධිකරණ උසාවියේ සංක්‍රමන පිළිබඳ නඩුවක ඇපැල, ෆෙඩරල් උසාවියේ විසුරුවකු පූර්ණ අධිකරණයක් මගින් ඇසිය යුතු යැයි අනුයෝජනය කරන්නෙ නැත්නම් තනි මහෙස්ත්‍රාත්වරයකු විසින් අසනු ඇත.

තනි විනිසුරුවකුගේ හෝ ශේෂ්ඨාධිකරණයකින් අසන ලද නඩුවක් සඳහාවූ ඇපැල සාමාන්‍ය වශයෙන් අසනු ලබන්නේ විනිසුරුවන් තිදෙනකු හෝ ඊට වැඩි විනිසුරු ගනනක් සහිත පූර්ණ අධිකරණයක් මගිනි.

# ඔස්ට්‍රේලියාවේ ෆෙඩරල් උසාවිය

# ඇපැල්

## ඔබ ඇපල් කරන්නේ කෙසේද ?

ඔබ අංක 55 දරණ පෝර්මය: ඇපැල් නොටීසිය සම්පූර්ණ කළයුතුය. මෙම පෝර්මයේ ඔබ ඇපැල්කරු යැයි කියන්නේ ඔබ ඇපැල් කරන පක්ෂය නිසාය.

ඇපැල් නොටීසියේ මුල් පිටපත හා අනෙක් පක්ෂයේ හැමටම එක පිටපත බැගින් ඇපැල් අධිකරණයට ඉදිරිපත් කළයුතුය. ඔබට මෙය රෙජිස්ට්‍රර් කාර්යාලයට පැමින හෝ තැපැල් හෝ ෆැක්ස් මගින් හෝ අන්තර්ජාලය මගින් කලහැක.මෙය ගොනුගත කිරීම වශයෙන් හැඳින්වේ. ගොනුගතකිරීම පිළිබඳ තවත් විස්තර රිජිස්ට්‍රර් කාර්යාලයෙන් හෝ අධිකරණ වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

ඔබ ලඟත් ඇපැල් නොටීසියේ පිටපතක් ඇති බැව් සහතික කරගන්න.

යම් ප්‍රාන්තයක හෝ දේශ භූමියක අධිකරණ තීන්දුවක් සඳහා ඇපැල් කරන්නේනම් ඇපැල් නොටීසියේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේත්, එම අධිකරණයේ නිසි නිලධාරියකු හෝ බලධරයකු සමගත් ගොනු කළයුතුය.

නොටීසිය නිවැරදි පෝර්මයේ නම් රිජිස්ට්‍රර් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් ඇපල් නොටීසියේ මුල් පිටපතේත් ' අනෙක් පිටපත්වලත් මුද්‍රා තබනු ඇත.

ඔබ ඇපැල ගොනුකර දින 5 ක් ඇතුලත සෑම වගඋත්තරකරුවකුටම මුද්‍රාතබනලද ඇපැල නොටීසි භාරදීමට පිළියෙල කළයුතුය.

## කාළ සීමා

අතුරු විණිසසුමක් නම්, සාමාන්‍යයෙන් කථාකරන විට, නඩුවක කුශලයට වඩා පටිපාටි කරුනු ගැන කටයුතු කෙරේ.අතුරු විණිසුම් සඳහා ඇපැල් කරහැක්කේ උසාවියේ අවසරය ඇතිවය.ඔබ මේ සඳහා ඇයදුම් කළයුත්තේ පෙඩරල් උසාවියේ තනි විණිසුරුවකු විසින් ප්‍රකාශිත විණිසුමකින් හෝ රීති නියමයකින් දින 7 ක් ඇතුලත හෝ වෙනත් උසාවියකින් ප්‍රකාශිත විසුමකින් හා රීති නියමයකින් දින 21 ක් ඇතුලතය., උදාහරණයක් වශයෙන් ෆෙඩරල් මහෙස්ත්‍රාත් උසවිය ඇපැල් කිරීමේ කාළසීමාව ගෙවී හෝ ගෙවීමට ලඟ නම් කාළය දික් කරගැනීමට ඉල්ලුම් කළයුතුය.

අවසාන විනිසුම් සඳහා වන ඇපැල් තීරණයෙන් දින 21 ක් ඇතුලත කළයුතුය. මෙම ඇපැල සඳහාවූ කාලය අවසන්වී හෝ අවසන්වීමට ආසන්න නම්වී කාළසීමාව දිගුකිරීමට ඔබට ඉල්ලුම් කළහැක.

## කෙතරම් වියදම් වේද ?

ඇපැල් නොටීසියක් ගොනු කිරීමේදී ගාස්තුවක් ගෙවිය යුතුයි.මෙම ගාස්තුව ඔබ ඇපැල අත්හැරීමේදී හෝ අස්කරගැනීමේදී හෝ ආපසු ලබාගත නොහැක.මෙම ගාස්තුව ගෙවීමට ඔබට නොහැකිනම් මෙම ගාස්තුව සංත්‍යාජනය කිරීමට ඉල්ලිය හැක.සමහර අය ගාස්තු

ගෙව්මෙන් මුක්ත කර ඇත. (උදාහරනයක් වශයෙන්, ඔබට නීති ආධාර ලැබේනම් හෝ ඔබ සෞඛ්‍ය රැකවරණ කාඩ් පතක් දරන්නෙක් නම්) ඔබට රිජිස්ට්ර් කාර්යාලයෙන් ගාස්තුව සංත්‍යාජනය කිරීමට ඉල්ලුම් කිරීමට හෝ ගාස්තු ගෙවීම මුක්ත කිරීමට අවශ්‍ය පෝර්මය ලබාගත හැක.

## මට වාසිදායක තීන්දුවක් සඳහා වෙනක් අයෙකු ඇපැල් කරන්නේ නම් කුමක සිදුවේද?

ඔබට ඇපල් නොටීසියක් භාරදී ඇත්නම් ඔබ වගඋත්තරකරු ලෙස ඇපැල් පරිපාටියේ හඳුන්වනු ඇත. අංක15 දරණ පෙනීසිටීමේ පෝර්මයක් පුරවා ඉදිරිපත් කර ඔබ එම කරුණ සඳහා පෙනීසිටිනබව ඇතුලත් කළයුතුය.

මුල් නඩුවේ තීන්දුවෙන් කොටසකට ඇපැල් කිරීමට හෝ මුල් තීන්දුවේ කොටසක් විචලනය කිරීමට ඔබට අවශ්‍යනම් හරස් ඇපැල් නොටීසිය නම්වූ පිකරනය කරනලද අංක 55 දරණ පෝර්මය පිරවිය යුතුය.

## ඇපැල් නොටීසිය ගොනුකිරීමෙන් පසු කුමක් සිදුවේද?

ෆෙඩරල් මහෙස්ත්‍රාත්වරයෙකුගේ විණිසුමක් සඳහාවූ ඇපැලක් නොවන්නේනම් රෙජිස්ට්‍රර් කාර්යාලය සාමාන්‍යයෙන් ඇපැල් පොතට මුල් නඩුවෙන් කුමණ වැදගත් කරුණු අඩංගු කර උසාවියට සැපයිය යුතුදැයි තීරණය කිරීමට දෙපක්ෂයටම සහභාගිවීමට වෙලාවක් නියම කෙරේ.මුල් නඩුවිභාගයේ සියලු ලේඛණ අදාලනොවිය හැක.මේ ක්‍රියාවලිය - ඇපැල් පොතේ සුචිය ස්ථාපිත කිරීම- යැයි පැවසේ.

ඇපැල ෆෙඩරල් මහෙස්ත්‍රාත්වරයකුගේ සංක්‍රමන පිලිබඳ නොවන විසුමක් නම් රෙජිස්ට්ර් කාර්යාලය ඇපැල නිර්දේශනනඩු විභාගයකට හෝ අවසාන නඩු විභාගකට දිනයක් වෙන්කරනු ඇත.

ෆෙඩරල් මහෙස්ත්‍රාත් උසාවියක සංක්‍රමණ පිලිබඳ නඩුවක් සඳහා කෙරෙන ඇපැලක් නම්, ඇපැල ඇසීමට සූදානම් වීමට අදාලවන ඇපැල් පොත් සඳහා උසාවිය විසින් කරනලද නිර්දේශන හෝ නියෝග, ලිඛිත ඉදිරිපත්කිරීම් සහ වෙනත් කරුණු ගැන රෙජිස්ට්ර්

කාර්යාලය ඔබට ලියා දන්වනුඇත. නැවත වරක් රෙජිස්ට්‍රාර් කාර්යාලය ඔබට ලිඛිතව ඇපෑල ඇසීමට යොදා ඇති දිනය දන්වනු ඇත.

ඔබ ඉදිරිපත් කරන කරුණුවල කටු සටහනක් උසාවියේ ගොනු කිරීමටත් වග උත්තරකරුවන්ට භාරදීමටත් අවශ්‍යය.

මෙම කටුසටහනේ සෑම පාදක කරුනකටම කෙරෙන තර්කවල සම්පිණ්ඩනයක් සහ ඔබේ නඩුව සඳහා පිහිටාධා කර ගැනීමට බලාපොරොත්තුවන නඩුවල ලැයිස්තුවක් අඩංගු වියයුතුය. විණිසුරුවකු වෙනත් දිනයක් නියමකලත් මෙය සාමාන්‍යයෙන් ඇපෑල ඇසීම පටන් ගැනීමට පැහැදිලි දින 5 කට පෙර කළයුතුය.

## නඩු විභාගය

මුලින්ම ඔබගේ නඩුව තර්කකිරීමට ඔබගෙන් ඉල්ලා සිටිනු ඇත. ඊට පසු වග උත්තරකරුට පිළිතුරු දීමට අවස්ථාව දෙනු ලැබේ. වග උත්තරකරු විසින් නගනලද දේ ගැන පිළිතුරු දීමට ඔබට අවසාන අවස්ථාවක් දෙනු ඇත. ඇපෑල් පොතේ අඩංගු දෑ ගැන ඔබට සමීප දැනුමක් තිබිය යුතු අතර ඔබගේ තර්කවලට පිහිටාධාරවීම සඳහා පොතෙන් උද්ධෘත පාඨ මගින් උසාවිය නිර්දේශනය කළයුතුය.

ඔබ සමර්ථ වුවහොත් උසාවිය:

- මුල් නඩුව විභාග කළ උසාවිය කරනලද විණිසුම වෙනුවට වෙනත් විණිසුමක් පනවනු ඇත: හෝ
- නැවත වරක් නඩුව ඇසීමට නියෝග කරනු ඇත.

## සාර්ථක වීමේ අවස්ථා මොනවාද ?

ඇපෑලක් සාර්ථකවීමට නම් ඔබ මුල් නඩුව ඇසූ විණිසුරු හෝ පෙඩරල් මහෙස්ත්‍රාත්තුමා විසින් වරදක් සිදුකර ඇති බවත් එම වරද විණිසුම සහමුලින්ම වෙනස්කිරීමට තරම් වැදගත්කමක් ඇති වරදක් බවත් උසාවියට ඒත්තුගැන්විය යුතුය.සමහර විශේෂ වැරදි සඳහා උදාහරන නම් මුල් නඩුව ඇසූ විණිසුරු හෝ පෙඩරල් මහෙස්ත්‍රාත්වරයා විසින්:

- වැරදි නීති ප්‍රතිපත්තියක් යෙදීම: හෝ
- වැදගත් පාදක කරුනක් සඳහා විනිශ්වයක් සාක්ෂි මගින් තහවුරු කල නොහැකි කරුනක් හෝ කරුනු මත පිහිටා දීම.

ඇපැල අසන උසාවිය:

- මුල් නඩුවේදී ඉදිරිපත් නොකළ කිසිම තොරතුරක් හෝ අලුත් සාක්ෂියක් (ඉතාමත් වැදගත් පරිවේෂනයකදී හැර) අවධානයට නොගැනේ.
- සාක්ෂි දීම සඳහා සාක්ෂිකරුවන් කැඳවන්නේ නැත:
- මුල් නඩුවේදී පක්ෂ මගින් ගොනු කරනලද අදාල සියලු ලේඛණ කියවනු ඇත.
- ලබාගත හැකිනම් මුල් නඩුවේ පිටපතේ අදාල කොටස් කියවනු ඇත.
- ඇපැල සඳහා කෙරෙන දෙපක්ෂයේම නීතිමය තර්කවලට ඇහුම්කන් දෙනු ඇත.

## නීති උපදෙස්

ඇපැල් නොටිසියක් හෝ හරස් ඇපැලක් කෙටුම්පත් කිරීම ඉතාමත් අමාරුය.එමනිසා ඇපැල් නොටිසියක් සූදානම් කිරීම නීති උපදෙස් සහිතව කිරීමට තදින් රෙකමදාරු කෙරේ.

ඔබට උසාවියෙන් නොමිලේ හෝ අඩුමිලට නීති උපදෙස් හෝ සහාය ලබා ගැනීමට හැකි ආයතන හමුවීමේ විස්තර දැනගතහැක නැත්නම් උසාවියේ වෙබ්අඩවිය බලන්න:

ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්.පෙඩ්කෝට්.ගව්.ඒයූ.

උසාවියේ කාර්යමණ්ඩලයට නීති උපදෙස් සැපයිය නොහැක.

## නීති ගාස්තු ගෙවන්නේ කවුද ?

ඔබ ඇපැලෙන් පරාජය වුවහොත් සාමාන්‍යයෙන් අනෙක් පක්ෂයේ නීති ගාස්තු ගෙවීමට නියෝග කෙරේ.

## මම ඇපැල ඉල්ලා අස්කරගන්නේ කෙසේද ?

අංක29 දරණ ෆෝර්මය: නතරකිරීමේ නොටිසිය පිරවීමෙන් ඔබේ ඇපැල ඉල්ලාඅස්කරගත හැක.තවම ඔබේ ඇපැල අසානැත් නම් නතරකිරීමේ නොටිසිය ගොනු කිරීමට උසාවියේ අවසරය අවශ්‍ය නොවේ. ඇපැල ඇසීම ආරම්භවී ඇත්නම් නැත්නම් ඇසීම අවසන්වී තවම නියෝගය දී නැත්නම් නතරකිරීමේ නොටිසිය ගොනුකිරීමට උසාවියේ අවසරය අවශ්‍යවේ.

ඔබ ඇපැල නතර කරන්නේ නම් සාමාන්‍යයෙන් අනෙක් පක්ෂයේ නීති ගාස්තු ගෙවීමට ඔබට නියෝග කරනු ඇත.

## ඕස්ට්‍රේලියාවේ මහාධිකරණයට කෙරෙන ඇපැල

ෆෙඩරල් උසාවියේ පූර්ණ අධිකරණයකින් හෝ ෆෙඩරල් මහෙස්ත්‍රාත් උසාවියේ තනි විනිසුරුවෙකු අසනලද ෆෙඩරල් මහෙස්ත්‍රාත්වරයකුඅසනු ලැබූ ඇපැලක තීරණයක් සඳහා මහාඅධිකරණයට ඇපැල් කිරීමට ස්වයංක්‍රීය අයිතියක් නැත.

ඇපැල් කිරීමට මහාධිකරණයෙන් අවසර ඉල්ලීමට ඔබ පුලුවන (මෙය - විශේෂ අවසර - යනුවෙන් හැඳින්වේ) නමුත් මෙය දෙනු ලබන්නේ විශෙෂ නඩුවලට පමණි.ඔබ මහාධිකරණයට ඇපැලක් ඉදිරිපත් කරන්නේ නම්, ඉල්ලුම් පතේ පිටපතක් තීන්දුව දුන් ප්‍රාන්තයේ හෝ දේ ශභූමියේ  ෆෙඩරල් උසාවියේ රෙජිස්ටර්කාර්යාලයටද ඉදිරිපත් කළයුතුය.

## ෆෝර්ම ලබාගතහැක්කේ කොතැනින්ද ?

මේ පත්‍රිකාවේ සඳහන් සෑම ෆෝර්මයක්ම ඕනෑම ෆෙඩරල් උසාවි රිජිස්ටර් කාර්යාලයකින්ම ලබාගත හැක. සමහර ෆෝර්ම පිරවීමට උපදෙස් අඩංගු පිටපතක්ද ඔබට දීමට ඔවුන්ට පුලුවන.

ෆෝර්ම සහ උපදෙස් උසාවියේ වෙබ් අඩවිය: ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්.

පෙඩ්කෝට්ගගව්.ඒයූ වලින්ද ලබාගතහැක.

## භාෂාපරිවර්තකයෝ

ඇපැල ඇසීමට භාෂාපරිවර්තකයකු සූදානම් කිරීමට උසාවියට පුලුවන. ඔබට භාෂාපරිවර්තකයකු අවශ්‍ය නම් අවම වශයෙන් ඇපැල ඇසීමට සතියකට කලින් උසාවිය ඇමතිය යුතුය.ඔබ රිජිස්ටර් කාර්යාලය සතියකට පෙර ඇමතුවේ නැත්නම් ඔවුන්ට භාෂාපරිවර්තකයකු ලබාගැනීමට නොහැකි වනු අතර නඩුවිභාගය ප්‍රමාද වේ.

ඔබට දුරකථන අංක 131 450 අමතා දුරකථන භාෂාපරිවර්තකයකුට කථා කළහැක.

# ෆෙඩරල් උසාවි රිජිස්ටර් කාර්යාල

**රිජිස්ටර් කාර්යාලය**
Commonwealth Law Courts Building
Childers Street
Canberra City ACT 2601
දුරකථනය: (02) 6267 0566
ෆැක්ස්: (02) 6267 0625
ටීටීවයි: (02) 6267 0537
ඊමේල්: actman@fedcourt.gov.au

**නිව් සවුත්වේල්ස් රිජිස්ටර් කාර්යාලය**
Level 17, Law Courts Building
Queens Square
Sydney NSW 2000
දුරකථනය: (02) 9230 8567
ටීටීවයි: (02) 9230 8270
ෆැක්ස්: (02) 9230 8535
ඊමේල්: nswdr@fedcourt.gov.au

**උතුරු දේශභූමි රිජිස්ටර් කාර්යාලය**
Level 3, Supreme Court Building,
State Square, Darwin NT 0800
තැපල් ලිපිනය: PO Box 1806
DARWIN NT 0801
දුරකථනය: (08) 8941 2333
ෆැක්ස්: (08) 8941 4941
ටීටීවයි: (08) 8982 0838
Registry Filing Fax: (08) 8941 4941
ඊමේල්: ntreg@fedcourt.gov.au

**ක්වීන්ස්ලන්ඩ් රිජිස්ටර් කාර්යාලය**
Level 6, Commonwealth Law Courts
119 North Quay
Brisbane QLD 4000
තැපල් ලිපිනය: P.O. Box 13084
George Street Post Shop
Brisbane QLD 4003
දුරකථනය: (07) 3248 1100
ෆැක්ස: (07) 3248 1260
ටීටීවයි: (07) 3248 1272
ඉමේල්: qldreg@fedcourt.gov.au

**වික්ටෝරියානු රිජිස්ටර් කාර්යාලය**
Commonwealth Law Courts
305 William Street
Melbourne VIC 3000
දුරකථනය: (03) 8600 3333
ෆැක්ස්: (03) 8600 3281
ටීටීවය: (03) 9670 0320
ඊමේල්: vicreg@fedcourt.gov.au

**දකුණු ඕස්ට්‍රේලියානු රිජිස්ටර් කාර්යාලය**
Level 5 Commonwealth Law Courts
3 Angas Street Adelaide SA 5000
Postal address: GPO Box 1350
Adelaide SA 5001
දුරකතනය: (08) 8219 1000
ෆැක්ස්: (08) 8219 1001
ටීටීවය: (08) 8219 1011
ඊමේල්: sareg@fedcourt.gov.au

**ටැස්මේනියානු රිජිස්ටර් කාර්යාලය**
Commonwealth Law Courts Building
39-41 Davey Street
Hobart TAS 7000
තැපල් ලිපිනය: GPO Box 903
HOBART TAS 7001
දුරකථනය: (03) 6232 1715
ෆැක්ස්: (03) 6232 1701
ටීටීවයි: (03) 6232 1865
ඊමේල: tasreg@fedcourt.gov.au

**බටහිර ඕස්ට්‍රේලියානු රිජිස්ටර් කාර්යාලය**
Commonwealth Law Courts
1 Victoria Avenue
Perth WA 6000
තැපල් ලිපිනය: GPO Box A30
PERTH WA 6834
දුරකථනය: (08) 9268 7100
ෆැක්ස්: (08) 9221 3261
ටීටීවයි: (08) 9325 7053
ඊමේල්: waregistry@fedcourt.gov.au

**ප්‍රධාන රිජිස්ටර් කාර්යාලය**
Level 17, Law Courts Building
Queens Square
Sydney NSW 2000
දුරකථනය: (02) 9230 8472
ෆැක්ස: (02) 9223 7706
ඊමේල: query@fedcourt.gov.au